# ව්‍යාපාර මූල්‍යකරණය

ව්‍යාපාරයක යොදවා ඇති සියලු අරමුදල් නොහොත් සියලුම ප්‍රාග්ධන ශක්තීන් ව්‍යාපාර මූල්‍ය ලෙස හැඳින්විය හැකි ය. මූල්‍ය යනු මුදල් පමණක් නොවේ. මුදල් යනු භාණ්ඩ හා සේවා හුවමාරුවේ දී යොදගන්නා ඕනෑම අතරමැදි දෙයකි. ව්‍යාපාර මුදල් හා ඉල්ලුම් තැන්පතු අප මුදල් ලෙස යොද ගනු ලැබේ. මූල්‍ය තුළ මුදල් ඇතුළු අනෙකුත් සම්පත් ඇතුළත් වේ.

මූල්‍ය කාර්යයන්

(1) මූල්‍යය සම්පාදනය (මූල්‍ය ණය)

(2) මූල්‍යය යෙදවීම (ආයෝජණය)

ව්‍යාපාරයක ශේෂ පත්‍රයක වම්පැත්තෙන් මූල්‍යනය ද දකුණු පැත්තෙන් ආයෝජනය ද විදහා දක් වේ.

| ......දිනට ශේෂ පත්‍රය | | | |
|---|---|---|---|
| ස්ථාවර ප්‍රාග්ධනය | XX | ස්ථාවර වත්කම් | XX |
| කාරක ප්‍රාග්ධනය | XX | ජංගම වත්කම් | XX |
| | XX | | XX |

ස්ථාවර ප්‍රාග්ධනය

ව්‍යාපාරයේ දිගුකාලීන අවශ්‍යතා සඳහා අවශ්‍ය ඉඩම් ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, රථවාහන හා කාර්යාල උපකරණ මිල දී ගැනීමට අවශ්‍ය අරමුදල් වේ.


කාරක ප්‍රාග්ධනය

ව්‍යාපාරයේ එදිනෙද කටයුතු සඳහා අවශ්‍ය කඩ කුලී ගෙවීම, වැටුප් හා වේතන ගෙවීම, ද්‍රව්‍ය මිල දී ගැනීම, විදුලිය ගෙවීම, දුරකථන ගාස්තු ගෙවීම ආදියට අවශ්‍ය මුදල් වේ.

ප්‍රශස්ත ස්ථාවර ප්‍රාග්ධන මට්ටම තීරණය කරන සාධක

1. ප්‍රාග්ධන පිරිවැය (ලබා ගැනීමේ හා තබා ගැනීමේ මිනුම්)
2. අවශ්‍ය ස්ථාවර ප්‍රාග්ධන ප්‍රමාණය
3. දිගුකාලීන මූල්‍ය වෙළෙඳ පොළේ ස්වභාවය
4. ස්ථාවර වත්කම් අගය වෙනස් වන ප්‍රමාණයන්
5. ක්ෂය ප්‍රතිපාදන ප්‍රමාණයන්

ස්ථාවර ප්‍රාග්ධන මට්ටම තීරණය වන ආකාරය




## අධිප්‍රාග්ධනය (Over Capitalization)

ස්ථාවර ප්‍රාග්ධන අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් දැකිය හැකි අවස්ථාවකි. ඒ අනුව ආයතනයේ ඉපැයීම් අනුපාතය යොදවා ඇති ප්‍රාග්ධනයට ප්‍රමාණවත් නොවීමයි. මෙහි ප්‍රධාන ලක්ෂණය නම් ස්ථාවර වත්කම්වල මූල්‍ය අගයට වඩා වැඩි බැරකම් ප්‍රමාණයක් තිබීම වේ. ඒ අනුව යොද ඇති ප්‍රාග්ධනයේ ඉපැයීම් ශක්තිය අඩු වේ.

### අධි ප්‍රාග්ධනයට බලපා ඇති සාධක

1. කොටස් හා ණයකර අනවශ්‍ය ලෙස නිකුත් කිරීම
2. ආරම්භක වියදම් විශාලවීම
3. උද්ධමනකාරී අවස්ථාවල දී භාණ්ඩ මිල දී ගැනීම
4. ඉහළ මට්ටමක ලාභාංශ ගෙවීම නිසා ලාභ ප්‍රති ආයෝජනය නොවීම
5. ව්‍යාපාරය ආරම්භකරන අවස්ථාවේදී ලාභ අතිරික්තව ඇස්තමේන්තු කිරීම
6. විශාල වශයෙන් ප්‍රාග්ධන නඩත්තු වියදම් ගෙවීම

### අධිප්‍රාග්ධනයේ බලපෑම

1. සමාගමට බලපාන ආකාරය

අතිරේක ප්‍රාග්ධනය සම්පාදනය අපහසුවීම

2. ලාභ තර කිරීම ගිණුම් උපක්‍රම යොදගත යුතුවීම
3. සංචිත හා වෙන්කිරීම ප්‍රමාණයට කළ නොහැකි වීම
4. ප්‍රාග්ධන ප්‍රතිසංවිධානයක් කිරීම තුළින් ව්‍යාපාරය ආරක්ෂාකර ගැනීමට කටයුතු කිරීම

2. කොටස් හිමියන්ට බලපාන ආකාරය

1. කොටස් මිල විශාලවීම
2. සේවා නියුක්ති ඉඩප්‍රස්ථා අඩු වීම
3. ලාභාංශ ප්‍රතිශතය අඩු වීම
4. කොටස් හිමියන් තෘප්තිමත් නොවන තත්ත්වයට පත් වීම
5. මහජන ප්‍රසාදය අඩු වීම
6. ප්‍රාග්ධන ප්‍රතිසංවිධානය මඟින් කොටස් හිමියන්ට පාඩු වීම

3. අධි ප්‍රාග්ධනයට පිළියම්

1. ණයකර හා ව.කො. නිදහස් කිරීම
2. සා. කො. අවප්‍රමාණය කිරීම
3. ප්‍රති ආයෝජනය තර කිරීම
4. ලාභාංශ ප්‍රතිශතය හා ණයකර පොලී ප්‍රතිශතය අඩු කිරීම
5. අතිරික්ත ස්ථාවර වත්කම් විකිණීම හෝ කුලියට දීම

## ඌණ ප්‍රාග්ධනය (Under Capitalization)

ව්‍යාපාරයේ කටයුතුවලට ප්‍රමාණවත් පරිදි ස්ථාවර ප්‍රාග්ධනය සම්පාදනය කර ගෙන නැති අවස්ථාවක් ලෙස ඌන ප්‍රාග්ධනය හැඳින්විය හැකි ය.

මෙහිදී ව්‍යාපාරයේ ස්ථාවර වත්කම්වල මූර්ත අගය ඒවායේ පොත්වල අගයට වඩා ඉහළ මට්ටමක පවතින බව පෙනේ. එසේම යෙදූ ප්‍රාග්ධනයේ ඉපැයීම් ශක්තිය ද ඉහළ මට්ටමක පවතී. තවත් අරමුදල් යොදවා වාසි ලබා ගැනීමට ආයෝජකයන්ට මේ යටතේ අවස්ථාව ලැබේ.

එකම කර්මාන්තයක යෙදී ඇති ව්‍යාපාර 2 ක් ගත්විට මෙය පැහැදිලි කරගත හැකි වේ.

ඒ නැමැති ආයතනය රු. ලක්ෂ 10 ක් යොද රු. ලක්ෂ 2 ක ලාභයක් ලබන අතර බී ආයතනය රු. ලක්ෂ 7 1/2ක් පමණක් යොද එම ලාභ ප්‍රමාණය වූ රු. ලක්ෂ 02 ලබන බව සිතමු.

ඒ අනුව ඒ ආයතනයේ ලාභය 20% ක් වන අතර බී ආයතනයේ ලාභය 26 2/3% ක් වේ.

මෙවැනි ව්‍යාපාරයක සාමාන්‍ය ලාභ ප්‍රතිශතය 20% ක් බව සිතතොත් බී ආයතනයේ තව ලක්ෂ 2 1/2ක් ආයෝජනය කර 20 % ක් ඉපැයීමේ හැකියාව ඇත.

### ඌණ ප්‍රාග්ධනය ඇතිවිය හැකි ආකාර කිහිපයකි

(1) ආරම්භ කරන විට අවශ්‍ය ප්‍රාග්ධන ප්‍රමාණය රැස්කර නොගැනීම

(2) සාම්ප්‍රදායික ලාභාංශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම

(3) බලාපොරොත්තු නොවන ආකාරයට ව්‍යාපාරයට ලාභ ලැබීම

(4) අනාගත ලාභ අඩු ප්‍රතිශතයක් වශයෙන් තක්සේරු කිරීම

(5) අධික කාර්යක්ෂමතාවක් ව්‍යාපාරය තුළ ක්‍රියාත්මකවීම

ඌන ප්‍රාග්ධනය මඟින් ව්‍යාපාරයට සිදුවන අවාසි කිහිපයකි. එවැනි මට්ටමේ ව්‍යාපාර අසාර්ථක ව්‍යාපාර ලෙස සැළකේ. සාමාන්‍ය කොටස් හිමියන් අධික ලාභාංශයක් භුක්ති වින්දත් එවැනි ව්‍යාපාරවල අනාගතය අවිනිශ්චිත තත්ත්වයක පවතී. එයට හේතුව පාරිභෝගිකයන්ට එම ආයතනයේ භාණ්ඩ හා සේවාවලට වැඩි මිලක් ගෙවීමට සිදුවීමත් සේවක උද්ඝෝෂණ ඇතිවිය හැකිවීමත් ය. ඌන ප්‍රාග්ධන තත්ත්වය අඩුකර දක්වා කටයුතු කිරීම වැදගත් වේ. ඒ සඳහා පියවර කිහිපයක් ගත හැකිය.

(1) ලාභ ප්‍රති ආයෝජනය කිරීම

(2) කොටස්වල නාමික අගය කුඩා අගයන්ට පරිවර්තනය කිරීම (රු. 10 කොටස් රු. 2/- රු 1/- බවට පත් කිරීම)

(3) සීමිත කොටස් හිමියන්ට එම ආයතනයේ ආයෝජනය කිරීම වැඩි කිරීමට අවස්ථාව ලබාදීම

## ප්‍රශස්ථ කාරක ප්‍රාග්ධන මට්ටම නිශ්චය කිරීමේ දී සැලකියයුතු කරුණු :

(1) ද්‍රවශීලතාව

(2) පිරිවැටුම් අනුපාතය

(3) ව්‍යාපාරයේ ස්වභාවය

(4) ගනුදෙනුවල ප්‍රමාණය

(5) ප්‍රාග්ධන ශක්තිය (ධාරිතාව)

**කාරක ප්‍රාග්ධනය හිඟවීමෙන් ව්‍යාපාරය මුහුණපාන ගැටලු :-**

(1) ද්‍රවශීලතාව හිඟවීමේ ප්‍රශ්නවලට මුහුණපෑම

(2) එදිනෙද ව්‍යාපාර කටයුතු කිරීමට අරමුදල් ප්‍රමාණවත් නොවීම

(3) වැඩි පොලියක් මත ණය මුදල් සපයාගැනීමට සිදුවීම

(4) හදිසි ඇනවුම් ප්‍රතික්ෂේප කිරීමෙන් පාඩුවීම

(5) බැංකු අයිරා ලබාගැනීමට නොහැකිවීම නිසා චෙක්පත් අගරුවීම

6) ගෙවීම් පමාවීම තුළින් මූල්‍ය කීර්තිනාමයට කැළලක් වීම

## අධි වෙළෙඳම හා ඌන වෙළෙඳම අතර වෙනස්කම්

ඌන කාරක ප්‍රාග්ධන තත්ත්වයක් මඟින් අධි වෙළෙඳම ඇතිවන අතර කාරක ප්‍රාග්ධන ශක්තිය අධික වුවත් ඇනවුම් භාරගැනීම නොකරන බැවින් ඌන වෙළෙඳමක් ඇති වේ.

කළමනාකරුවන් හා සේවකයන් ගේ අධික කාර්යක්ෂමතාවක් අධි වෙළෙඳමේ දී දක්නට ඇති අතර ඌන වෙළෙඳමේ දී කළමනාකරුවන් හා සේවකයන් උදාසීනව කලකිරීමෙන් කටයුතු කරන පිරිසක් බව පෙනේ.

මෙම සීමා දෙකම ව්‍යාපාරයට අවාසි දයක වේ. එවැනි තත්ත්වයන්ට වහාම පිළියම් යෙදීම වැදගත් වේ.

අධි වෙළෙඳම සම්බන්ධයෙන් ගතයුතු පියවර වනුයේ වෙළෙඳ කටයුතු සීමාකර කාරක ප්‍රාග්ධනය වැඩිකර ගැනීමට කටයුතු කිරීම වේ. ඒ සඳහා කාරක ප්‍රාග්ධනය වැඩිකර ගැනීමේ මාර්ග යොදගැනීම වැදගත් වේ.

* කෙටිකාලීන ණය ලබා ගැනීම
* බැංකු අයිරාවක් ලබා ගැනීම
* ඉදිරිදතම චෙක්පත් භාවිතය
* වෙළෙඳ ණය උපයෝගි කර ගැනීම
* ණයගැතියන් වට්ටම් කිරීම
* ගෙවීම් පමා කිරීම

ඌන වෙළෙඳම හා අධි වෙළෙඳම යන තත්ත්වයන් දෙකම ව්‍යාපාරයේ මුදල් තත්ත්වය කෙරෙහි ඍජුව ම බලපායි. ඌන වෙළෙඳම නිසා මුදල් ශේෂය ඉහළ යන අතර අධි වෙළෙඳම නිසා මුදල් ශේෂය පහළ යයි.

## ප්‍රමාණවත් මුදල් ශේෂයක් නොතිබීමේ ප්‍රතිවිපාක

(1) වාසිදයක පරිදි අත්පිට ගැනුම් කළ නොහැකිවීම

(2) ව්‍යාපාරික කටයුතු අඩපණවීම

(3) එදිනෙද ව්‍යාපාර කටයුතුවලට ගෙවීම් කිරීමට නොහැකිවීම

(4) ගනුදෙනුකරුවන් අධෛර්යමත් නොවීම

(5) හදිසියේ වැඩි පොලියට පිටතින් මුදල් ගැනීමට සිදුවීම

## මුදල් තත්ත්වය දියුණු කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග

(1) අත්පිට විකුණුම් වැඩිකර ණයට විකුණුම් අඩු කිරීම

(2) අත්පිට ගැනුම් අඩුකර ණය ගැණුම් වැඩිකර ගැනීම

(3) බැංකුවේ අණලත් ලැබීම් විධිමත්ව රැස්කරවා ගැනීම හා අණලත් ගෙවීම් පමා කිරීමට කටයුතු කිරීම

(4) ඉදිරිදතම චෙක්පත් භාවිතය

(5) ණය ගැතියන්ගෙන් ඉක්මනින් මුදල් එකතුකර ගැනීම

## අභ්‍යන්තර හා බාහිර ප්‍රාග්ධන අතර සබඳතාව

ව්‍යාපාරය තුළින් ම අරමුදල් සම්පාදනය කර ගැනීම අභ්‍යන්තර මූල්‍ය මාර්ග වේ. අභ්‍යන්තර මූල්‍ය මාර්ග කිහිපයකි.

**නොබෙදූ ලාභ**

ව්‍යාපාරයෙන් ආදයම් බදු ගෙවා තවත් කොටසක් ලාභාංශ ගෙවූ පසු ඉතිරි ඒවා නොබෙදූ ලාභ වේ. ඒවා ව්‍යාපාරය තුළ ම ආයෝජනය කරනු ලැබේ.

**(2) සංචිත හා වෙන් කිරීම් යොද ගැනීම**

ව්‍යාපාරයේ අනාගත දියුණුව සඳහා යොදගන්නා වර්තමාන ලාභයෙන් වෙන්කර ඇති අරමුදල් ලෙස සංචිත හැඳින්විය හැකිය. මේවා අයභාර සංචිත හා ප්‍රාග්ධන සංචිත ලෙස කොටස් 2 කි. අයිතිකරුවන්ට ලාභ හෝ ලාභාංශ වශයෙන් බෙදිය හැකි සංචිත හඳුන්වන්නේ අයභාර සංචිත වශයෙනි. අයිතිකරුවන්ට ලාභ හෝ ලාභාංශ වශයෙන් ආපසු ගත නොහැකි අරමුදල් ප්‍රාග්ධන සංචිත වේ. පොදු සංචිත අයභාර සංචිතයකි. ප්‍රාග්ධනය නිදහස් කිරීමේ සංචිත අරමුදල ප්‍රාග්ධන සංචිතයකි.

වෙන්කිරීම් යනු අනාගතයේ දී ඇතිවේයැයි අපේක්ෂා කරන යම් වියදමක් වෙනුවෙන් වර්තමාන වර්ෂයේ දී ලාභයෙන් වෙන්කරන මුදල් වේ. නිදසුන් වශයෙන් ක්ෂය වෙන් කිරීම්, අඩමාන ණය වෙන් කිරීම් දැක්විය හැකිය. ක්ෂය වෙන් කිරීම් ආදිය වර්ෂයකට වැඩි කාලයක් ව්‍යාපාරය තුළ තිබෙන බැවින් එය ඒ තාක් කල් අභ්‍යන්තර මූල්‍ය මාර්ගයක් ලෙස යොද ගත හැකි වේ.

**3. කාරක ප්‍රාග්ධනය වැඩිකර ගැනීමේ මාර්ග**

ව්‍යාපාරයක කාරක ප්‍රාග්ධනය වැඩිකර ගැනීමේ මාර්ග අභ්‍යන්තර මූල්‍ය මාර්ග ලෙස යොදගත හැකි වේ. ඒවා අතර ඉහත දක්වා ඇති මාර්ග යොදගැනීම කළ හැකි වේ.

**ව්‍යාපාරයක බාහිර මූල්‍ය මාර්ග :**

ව්‍යාපාරයකට තම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා යොද ගතහැකි බාහිර මූල්‍ය මාර්ග කිහිපයකි.

1. කොටස් නිකුත් කිරීම
2. ණයකර නිකුත් කිරීම
3. උකස් ණය
4. වාණිජ බැංකු දිගු කාලීන, කෙටි කාලීන ණය හා බැංකු අයිරා
5. බැංකු නොවන මූල්‍ය ආයතනය
6. කල්බදු ණය
7. කුලීපිට ණය
8. ප්‍රාග්ධන සමාගම් මඟින්
9. දේශීය හෝ විදේශීය සමාගම්වලින් ලබාගන්නා ණය හා ආධාර

**මතු සම්බන්ධයි**